පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

ආයතනය : නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

<u>පළමු කොටස</u>

අනු අංකය	2021 මුදල් වර්ෂය සඳහා අදාල කාර්යසාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගන ඇති දුර්වලතා	නිවැරදි කර ගැනීම සඳහා ආයතනය විසින් ගෙන ඇති පියවර හා වර්තමාන තත්වය
01.	බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2020 අගෝස්තු මාසයේ අමාත්‍යාංශය ආරම්භ කරන ලද අතර එම අවස්ථාවේ බඩු වට්ටෝරු ලේඛන යාවත්කාලීන කිරීමේ අඩුපාඩු පැවතියද පසුව ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
02.	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2020 අගෝස්තු මාසයේ අමාත්‍යාංශය ආරම්භ කරන ලද අතර එම අවස්ථාවේ පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාමේදී අඩුපාඩු පැවතියද පසුව එය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
03.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි	2021 වර්ෂයේදී අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට ප්‍රමාදයක් පැවතියද පසුව අදාල කාලය තුල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නිසි කාලය තුළ පිළිතුරු ඉදිරිපත් කර ඇත.
04.	මු.රෙ 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර ඇත. එම වාර්තා පහත දිනයන්හිදී විගණකාධිපති වෙත ලබාදී ඇත.

අංකය	වාර්තාවේ විෂය	වාර්තා විගණකාධිපති වෙත යැවූ දිනය
01.	Internal Audit Observation (Development Project) dated 2021.05.03	Due to the covid pandemic documents delivered without enter into delivery book.
02.	Development Project Poor Financial Progress dated 2021.05.05	
03.	Internal Audit Observation (Progress of Recurrent & Capital Expenditure – 2021 dated 2021.05.18.	
04.	Development Project Poor Financial Progress dated 2021.06.08	

		05. Report for Vouching paid document Jan. & Feb. 2021 dated 2021.06.10. 06. Report for Vouching paid document March & April 2021 dated 2021.06.17. 07. 2020 වර්ෂයේ සිදු කරන ලද අමාත්‍යාංශ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සම්බන්ධවයි. දිනය 2021.06.22. 08. MCUDP Board of Survey – 2020 Dated 2021.07.14 09. Vehicle Maintenance – Dated 2021.06.29. 10. Report for Vouching paid document of May & June 2021 dated 2021.10.29 11. Report for Vouching paid document July, August 2021 – Dated 2021.11.01 12. Report for Vouching paid document September 2021 dated 2021.11.02	
05.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරේක, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ තුලින් අනාවරණය වූ ඌනතා පිළිබඳ මු.රෙ 103/104, 109 ප්‍රකාරව කමිටු පත්කර ඒ අනුව කටයුතු කිරීමේදී කල් පමාවක් සිදුවූ නමුත් පසුව එම කාර්යයන් අවසන් කර ඇත. මීට අමතරව අතිරික්ත හා අනෙකුත් නිර්දේශයන් සම්බන්ධයෙන්ද දැනට කටයුතු කර අවසන් කර ඇත.	
06.	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	මෙම අමාත්‍යාංශය 2020 වර්ෂයේ ආරම්භ කළ අතර පැවති වාහන වලින් වාහන 05 ක් මූල්‍ය කල්බදු පදනම මත ලබාගත් වාහන වන අතර වාහන 02 ක් ජනාධිපති කාර්යාලයෙන් ලබාගෙන ඇත. එම වාහන 02 නාගරික සංවර්ධන අමාත්‍යාංශය නමට පවරාගෙන ඇත.	
07.	වාහනයක් ගර්භීත වී මාස අටකට වඩා අඩුකාලයකදී අපහරණය කර නොතිබුණි.	එවකට පැවති වාහන සියල්ල ධාවනයට යොදවා තිබූ අතර PH-0894 දරණ වාහනය රිය අනතුරකට ලක්ව රක්ෂණ වන්දි ලබාගැනීමට කටයුතු කරමින් පැවතින. ඒ අනුව ගර්භීත වාහන කිසිවක් අමාත්‍යාංශය සතුව පැවත නැත.	

08.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	එවකට පැවති වාහන වලින් PH-0894 හා KG 5473 රිය අනතුරකට ලක්ව තිබූ අතර එම වාහන වලින් PH-0894 දරණ වාහනයේ සම්පූර්ණ මු.රෙ අනුව කටයුතු කර අවසන් කර ඇත. එමෙන්ම KG 5473 දරන වාහනයට රක්ෂණ වන්දි ලබාගෙන මු.රෙ 103, 104(3), 104 (4) පරීක්ෂණ පවත්වා අදාල වාර්තාවද සම්පූර්ණ කර ඇත.
09.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි.	2021 වර්ෂයේ සංචිතයේ වාහන 02 ක් පමණ අමාත්‍යාංශයේ තිබූ අතර එයින් NC-6707 දරණ වාහනයේ ඉන්ධන පරීක්ෂාව 2022 වර්ෂයේ සිදුකරන ලදී. PG–9739 දරන වාහනය 2022 වර්ෂයේදී ගරු ඇමතිතුමා වෙත වෙන්කර දී ඇත.
10.	මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර තිබුණි.	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ගිවිසුම් හා බැඳීම් උපදේශණ සේවා හා වැට් බදු ගෙවීම් සඳහා වන වියදම් නිසා ප්‍රතිපාදන සීමාව ඉක්මවා තිබූ නිසා මෙම බැරකම් නිර්මාණය වී ඇත. මෙවැනි තත්වයන් අවම වන පරිදි මේ වන විට කටයුතු කරමින් පවතී.

දෙවන කොටස

01.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.	අමාත්‍යාංශය ආරම්භක අවධියේ වූ බැවින් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර නොතිබූ අතර මේ වන විට පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතී.
02.	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදකයක් සකස් කර නොතිබුණි.	පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම හා අධීක්ෂණය හා ඇගයීම අතිරේක ලේකම් (පාලන හා ප්‍රතිපත්ති) යටතේ සිදු කිරීමට ක්‍රමවේදයක් සකස්කර ඇත.
03.	සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු පට්ටමක පැවතුණි.	2021 වර්ෂයේදී රටේ පැවති කොවිඩ් වසංගත තත්වය ආදී කරුණු නිසා මානව සම්පත් සංවර්ධන සැලස්මක් සකස් කර ඒ අනුව පුහුණු අවස්ථා සඳහා යොමුවීමක් නොවිය. කෙසේ වෙතත් 2023 වර්ෂයේ සිට අදාල කාර්යසාධක ගිවිසුම් අත්සන් කර ඒ අනුව පුහුණු අවස්ථා ලබාදෙමින් පවතී.

04.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හා අහිතකර මට්ටමේ විය.	2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් හෝ අහිතකර මතයක් නොවන අතර 2022/05/30 දින විගණකාධිපති නිකුත්කර ඇති වාර්තාව අනුව එය යටත්ම මතයක් වේ.
05.	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු සම්බන්ධයෙන් අයකර ගැනීමක් මේ දක්වා අමාත්‍යාංශයට වාර්තා වී නොමැත.

ප්‍රසන්න රණතුංග (පා.ම.)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.